**හෝමාගම ප්‍රාදේශීය සභාව - 2023**

---------------------------------------

# 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

හෝමාගම ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට හෝමාගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කල මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය

හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු බැකෝ ලෝඩරය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් ගෙවිය යුතු වියදම් රු.1,300,000 දෙවරක් ණයහිමි ලෙස ගිණුම්ගත කර තිබුණි. | ණයහිමි ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2023 නොවැම්බර් 01 දින මිලදී ගෙන තිබූ වටිනාකම රු.1,927,500ක් වූ Solar Lamp 15 ක් ස්ථාවර වත්කම් යටතේ දක්වා නොතිබුණි. | එම වත්කම් මිලදී ගන්නා ලද්දේ පුනරාවර්තන වැය ප්‍රතිපාදන තුළින් බැවින් ස්ථාවර වත්කම් යටතට නොගත් නමුත් දරණ ලද පිරිවැය හා පවත්නා ජීව කාලය පදනම් කර ගනිමින් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කරන බව. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | හෝමාගම පොදු වෙළඳ සංකීර්ණයේ ඌරු මස් කඩය බදු දීම වෙනුවෙන් 2023 වර්ෂයේ මාස 2ක් සඳහා ලැබී තිබූ රු.375,558 ක චෙක්පත අගරු වී තිබූ අතර ඒ සඳහා ගෙවිය යුතු දඩය වන රු.18,778 ක් හා එම කඩ කාමරය වෙනුවෙන් ලැබියයුතු හිඟ විදුලි බිල වන රු.33,641 ක් ලැබිය යුතු ඈ ලෙස සටහන් කර නොතිබුණි. | විදුලි බිල් ලැබිය යුතු ඈ ලෙස සටහන් කිරීම අතපසු වී තිබූ බව සහ දඩ මුදලද අය කරගත යුතු වුවත් ලැබිය යුතු ලෙස සටහන් කිරීම මගහැරී ඇති බව. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2023 දෙසැම්බර් 31 දිනට පිරිවැය අගයට දක්වා තිබූ රු.233,517,988ක ගොඩනැගිලි සඳහා ක්ෂය කිරීම් සිදු කර නොතිබුණි. | ගොඩනැගිලි ක්ෂය කර නොමැති බව. | වත්කම් ප්‍රත්‍යාගණනය කර ක්ෂය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ගැලපුම් ලෙස දක්වා තිබුණු රු.636,706ක සෘණ ශේෂයක් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය. | පිළිතුරු ලබාදී නැත. | නිවැරදි තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර ඇති සටහන් අංක 8 හි ගමන් ගාස්තු වියදමේ එකතුව රු.1,377,484 ක් සහ ඒ සඳහා ලබාදී ඇති වියදම් උප ලේඛනයේ ඇතුලත් ගමන් ගාස්තු වියදමේ එකතුව රු.1,484,799 ක් වූයෙන් රු.107,315 ක වෙනසක් පැවතුණි. | සටහන් අංක 08 හි ගමන් ගාස්තු වියදමේ එකතුව රු. 1,377,484,89 නිවැරදි වන අතර වියදම් උපලේඛනයේ ඇතුළත් ගමන් ගාස්තු වියදමේ එකතුව ඇමුණුම 09 (i) (ii) පරිදි සංශෝධනය විය යුතු බව | වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂයය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | විදුලි භාණ්ඩ තොගය | 43,320 | බින්කාඩ් පත්‍ර / පරීක්ෂා කළ හැකි වෙනත් ලියවිලි | කිසිදු මූලාශ්‍ර ලේඛනයක් සොයාගත නොහැකි බැවින් වර්ෂ ගණනාවක සිට පැවත එන භෞතිකව පෙන්නුම් නොකරන මෙම තොග ශේෂයන් ගැලපීම පිළිබඳව ගැටළු තවදුරටත් පවතින බව. | පරීක්ෂණ පවත්වා ගැටළුව විසදා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සාමාන්‍ය ගබඩා භාණ්ඩ තොගය | 8,361,983 | බින්කාඩ් පත්‍ර / පරීක්ෂා කළ හැකි වෙනත් ලියවිලි | කිසිදු මූලාශ්‍ර ලේඛනයක් සොයාගත නොහැකි බැවින් වර්ෂ ගණනාවක සිට පැවත එන භෞතිකව පෙන්නුම් නොකරන මෙම තොග ශේෂයන් ගැලපීම පිළිබඳව ගැටළු තවදුරටත් පවතින බව. | -එම- |
| (ඇ) | ආපසු ගෙවිය යුතු තැන්පත් | 4,981,664 | උපලේඛන | හඳුනා නොගත් පොදු තැන්පතු ශේෂයන් 2024 වර්ෂයේදී ආදායමට ගැනිමට කටයුතු කරන බව | අදාල උපලේඛනය විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 143(1) වගන්තිය | ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයේ අනුකූලතා සහතික ලබා දුන් ගොඩනැඟිලි 107කට අදාලව අළුත් තක්සේරුවක් ලබා දී නොතිබුණි. | වරිපනම් අංක නිකුත් කර නොතිබුණු දේපල 68 ක් සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව සිදුකරන නව තක්සේරුව තුළින් වරිපනම් වටිනාකම් | කඩිනමින් තක්සේරු කිරීමට පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | නිවැරදි ලෙස සංශෝධනය වන බව. | |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්තික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xiii නිවාඩු පරිච්ජේදයේ 22.4 වන ජේදය | සියළුම වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර විගණකාධිපති වෙත මාස්පතා වාර්තා කළ යුතු වුවත් සභාව විසින් වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර විගණනය වෙත වාර්තා කර නොතිබුණි. | විගණකාධිපති වෙත මාසිකව වාර්තා කිරීමට පියවර ගන්නා බව. | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මු. රෙ. 110 (1) | 2022 සහ 2023 යන වර්ෂ වල ප්‍රාදේශීය සභාව තුල සභාව සතු භාණ්ඩ හොරකම් / නැතිවීම් සිදු වී තිබුණද හානිවීම් ලේඛනයක සටහන් කිරීම සඳහා සභාව විසින් හානිපාඩු ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | ඉදිරියේදී නිවැරදිව හානි හා පාඩු ලේඛනයට පවත්වාගෙන යනු ලබන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ii)මු.රෙ.3 41 316(ඇ) | උපපත්‍රිකා පොත් 3340 ක් සම්බන්ධයෙන් උපපත්‍රිකා පොත් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | විගණනයෙන් පෙන්වා දුන් පරිදි උප පත්‍රිකා ලේඛනයක් සකස් කර එය ක්‍රියාත්මක කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (iii)මු.රෙ .571 | 2009 වර්ෂයේ සිට පැවත එන වර්ෂ 02 ඉක්ම වූ රු.18,635,215ක පොදු කර්මාන්ත තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2024 වර්ෂය තුළදී ආදායමට ගැනීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | මධ්‍යම පරිසර අධිකාරියේ 2023 මාර්ගෝපදේශ සංග්‍රහයේ 2:3:2 ජේදය ( ඇ ) හා 3.1 ජේදය | පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර 22ක් පසුගිය වර්ෂයේ සහ ප්‍රවර්ථන වර්ෂයේ බලපත්‍ර ලබා නොගෙන ව්‍යාපාරික කටයුතු සිදුකර තිබුණි. | විගණන විමසුමේ සඳහන් ව්‍යාපාර ස්ථාන 22 සම්බන්ධයෙන් මේ වන විට ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | බස්නාහිර පළාත් පාලන කොමසාරිස්ගේ 2016 අප්‍රේල් 28 දිනැති අංක LGD/04/2016 දරන චක්‍රලේඛය | චක්‍රලේඛයේ සඳහන් ක්‍රියාපටිපාටිවලින් බැහැරව රු.80,000,000 ක් වූ ස්ථාවර තැන්පතු මුදල් 2023 පෙබරවාරි සහ මාර්තු මාසයන්හිදි ආපසු ලබාගෙන තිබූණි. | ඉදිරියේදී චක්‍රලේඛයට අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.7.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.11 ප්‍රකාරව වැට් බදු ගෙවීම් පිළිබඳ විස්තර මුදල් ගෙවීමෙන් පසු ඊළඟ මාසයේ 15 වනදාට හෝ එදිනට පෙර විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම් දිය යුතු වුවත් සභාව විසින් 2023 වර්ෂයේදී ගෙවන ලද රු.4,846,017ක වැට් බදු පිළිබඳව එපරිදි කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී බදු ගෙවීම් පිළිබඳ වාර්තාව ඉදිරි මස 15 වන දිනට පෙර විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත වාර්තා කිරීමට කටයුතු කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.373,112,282 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ වියදම රු.37,738,951 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැ.31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැ.31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i)වරිපනම් හා බදු | 228,802,100 | 178,254,149 | 176,899,549 | 123,023,521 | 137,990,912 | 283,704,571 | 170,489,809 | 117,009,558 |
| (ii)කුලී | 18,969,400 | 19,435,205 | 18,521,551 | (9,000) | 17,167,850 | 240,392,750 | 13,463,734 | 226,929,015 |
| (iii)බලපත්‍ර ගාස්තු | 5,790,600 | 4,746,440 | 4,838,438 | 25,060 | 6,100,556 | 4,062,484 | 3,946,625 | 115,859 |
| (iv)වෙනත් ආදායම් | 632,928,600 | 843,659,755 | 973,412,950 | 620,965,649 | 359,252,660 | 981,255,856 | 431,474,550 | 549,781,305 |
| එකතුව | 886,490,700 | 1,046,095,549 | 1,173,672,488 | 744,005,230 | 520,511,978 | 1,509,415,661 | 619,374,718 | 893,835,737 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට සභාවට අයවිය යුතු වරිපනම් වටිනාකම රු.122,835,410ක් මෙතෙක් අයකරගෙන නොතිබුණි. | මෙම හිඟ ශේෂයන් අයකර ගැනීම සඳහා සියළු උත්සහයන් දරන බව. | හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පිහිටි සිනමා ශාලාවක් විසින් 2022 වර්ෂය සඳහා විනෝද බදු සභාව වෙත විගණිත දින වන විටත් ගෙවා නොතිබීම සම්බන්ධව අධිකරණමය තීරණ ගන්නා බව 2023 මැයි 22 දින කමිටු තීරණයක් ඇතත් ඒ සම්බන්ධව ආයතනය දැනුවත් කර බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වැඩිදුර උපදෙස් සඳහා අමාත්‍යාංශ ලේකම් වෙත යොමුකර ඇති බව. | සිනමා ශාලා විනෝද බදු අයකර ගැනීමට කඩිනමින් පියවර ගත යුතුය. |
| (ඇ) | ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ මුදල කොපමණද යන්න ගණනය කර නොතිබූ අතර ලැබිය යුතු මුද්දර ගාස්තු ප්‍රමාණය රු.326,678,000 ක් විය. | 2022 වර්ෂයට අදාළ ගාස්තු ප්‍රමාණය බව. | අයවිය යුතු මුද්දර ගාස්තු අයකර ගැනීමට කඩිනමින් පියවර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජල සැපයුම ලබා ගැනීම සඳහා මාර්ග පළුදු කිරීම් වෙනුවෙන් එම මාර්ග හානි පෞද්ගලිකව සකස් කර ගැනීමට යටත්ව, වර්ෂ 2022 සහ 2023 පිළිවෙලින් මාර්ග 58කට සහ මාර්ග 5කට අදාළව ලැබිය යුතු රු.5,565,440ක මුදලක් මාර්ග යථාතත්ත්වයට පත්කළ බවට පරික්ෂා කිරීමකින් තොරව සභා තීරණයක් මත නිදහස් කර තිබුණද එම පාරවල් නැවත සකස් කර ඇද්ද යන්න පසුවිපරමක් කර නොතිබුණි. | ජල සැපයුම ලබා ගැනිම් සඳහා මාර්ග පළුදු කිරිම් 58ක් වෙනුවෙන් 2022 වර්ෂයේදිද 05ක් වෙනුවෙන් 2023 වර්ෂයේදිද සභා තිරණ මත තැන්පත් මුදල් නිදහස් කර තිබූ බව. | මාර්ග යථා තත්ත්වයට පත්කළ බවට තහවුරු ලබා ගැනීමෙන් පසු තැන්පත් මුදල් නිදහස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කොරෝනා රෝගී තත්ත්වය යටතේ මියගිය අයගේ මෘතදේහ ආදාහනය කිරීමට සභාව විසින් 2021,2022 වර්ෂවලට අදාල වැයකර තිබුණු රු.1,176,600 ක මුදලක් සභාව වෙත පළාත් පාලන දෙපාර්තමේන්තුව (බස්නාහිර පළාත) වෙතින් 2023 වර්ෂය අවසන් වන විටත් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි. | නැවත පළාත් පාලන කොමසාරිස් වෙත සිහි කැඳවීම් කර ඇති බව. | ලැබියයුතු මුදල් කඩිනමින් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සභාව වෙත ඉදිරියේදි ලැබේ යැයි කිසිසේත් අපේක්ෂා කළ නොහැකි රු.2,749,290 ක වටිනාකමක් ලැබිය යුතු පොදු අත්තිකාරම් ශේෂයක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 1999 වර්ෂයට හා ඊට පෙර කාලපරිච්ඡේදයට අයත් නොපියවූ අත්තිකාරම් ශේෂය කපා හැරීම සඳහා අනුමැතියට පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත යොමු කිරීමට ලේඛන සොයා ගැනීමට නොහැකි වී ඇති බව. | නිරවුල් කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) | 2023 දෙසැම්බර් 31 දිනට මිශ්‍ර ණයහිමි, ගබඩා ණයහිමි, පොදු කර්මාන්ත ණයහිමි හා පළාත් සභා ණයහිමි ශේෂය රු.103,934,178 ක් විය. | 2024 වර්ෂයේදී ආදායමට ගැනීමට කටයුතු කරන බව. | විධිමත් අනුමැතියක් ලබා ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉඩම් නිරවුල්කර නොගැනීම සහ ගිවිසුමේ වැරදි සහගතභාවය නිසා සභාවට ලැබීම අවිනිශ්චිත වූ මීගොඩ ආර්ථික මධ්‍යස්ථානයෙන් 2023 වර්ෂය සඳහා ලැබිය යුතු කුලී ආදායම රු.900,000ක් හා හිඟ හිටි දඩය රු.27,450,000ක් වර්ෂයේ ආදායමට ගැලපීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.28,350,000ක් වැඩියෙන් දක්වා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුළු මුදල රු.255,150,000 අයකර ගැනීම අවිනිශ්චිත විය. | බිම් සවිය සඳහා ඉඩම් මැනීමේදි මෙම ඉඩමේ අයිතිය රජය ලෙස සඳහන් කිරීම හේතුවෙන් මෙම දේපළ සභාව සතු දේපළක් නොවන බවට මීගොඩ ආර්ථික මධ්‍යස්ථානයේ භාරකාර මණ්ඩලයේ තර්කය මත කුලී මුදල් ගෙවීම නතර කර ඇති බව. | මෙම දේපලෙහි නීත්‍යානුකූල අයිතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුණසිංහගම පෙර පාසල හා ප්‍රජා ශාලාව ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරු සමග2020 දෙසැම්බර් 31 දින රු.11,542,534 කට ගිවිසුම්ගතවී මුළු පිරිවැය ලෙස රු.2,512,333 ක් වැය කර තිබුණි. පැරණි ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමට මාස 04 ක කාලයක් ගත වීම, පළමු බිල්පත ගෙවීම මාස 08 කින් ප්‍රමාදවීම, දෙවන බිල්පත නොගෙවීම නිසා ගොඩනැගිල්ල ඉදිකිරීමට ප්‍රමාද වීමට | ඉදිකිරීමේ ප්‍රමාදයන් සිදු වූ බව පිළිගන්නා අතර ඉදිරියේදී සිදුවන ඉදිකිරීම් කටයුතු වලදී මෙම ප්‍රමාදයන් අවම කරගත හැකි අයුරින් කටයුතු කිරීමට දැඩි අවධානය යොමු කරන බව. | ඉදිකිරීම් කටයුතු වලදී සිදුවන ප්‍රමාදයන් අවම කරගත හැකි අයුරින් කටයුතු කිරීමට |

| | |
|---|---|
| හේතු වශයෙන් දක්වා තිබූ අතර වසර 02ක් තුල විශාල ලෙස ගොඩනැගිලි ද්‍රව්‍ය මිල ඉහළ යාම නිසා ගොඩනැගිල්ලේ වැඩ ඉටු කළ නොහැකි බව දන්වා කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම අතහැර දමා තිබුණි. | අවධානය යොමු කළ යුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.38,646,378 ක සේවක ණය ශේෂයෙන් මිය ගිය, විශ්‍රාම ගිය, සේවය හැර ගිය හා ස්ථාන මාරුවීම් ලද 25 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1,675,957 ක් වූ ආපදා හා උත්සව ණය මුදල් අයකර ගැනීමට පියවරගෙන නොතිබුණි. | 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු සේවක ණය ශේෂය තුළ මිය ගිය, විශ්‍රාම ගිය, සේවය හැර ගිය හා ස්ථාන මාරුවීම් ලද 25 දෙනෙකුගෙන් අයවිය යුතු මුදල 1,675,957.25 බව. | සේවක ණය මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැය විෂයයන් 71ක් සඳහා සලසා තිබූ එකතුව රු.17,006,000ක් වූ ප්‍රතිපාදන මුළුමනින්ම ඉතිරි වී තිබුණි. | පිළිගන්නා බව | අවශ්‍යතාවය හඳුනාගෙන එය පදනම් කරගෙන අයවැය පිළියෙල කිරීම කළ යුතුය. |
| (ආ) | වැය විෂයය 41ක් වෙනුවෙන් රු.19,277,100ක් වෙන්කර තිබුණද එයින් සියයට 75කට වඩා වැඩි ප්‍රමාණයක් වැය කර නොතිබූ අතර එම ප්‍රමාණය රු.17,585,952 ක් විය. | පිළිගන්නා බව | අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදා ගත යුතුය. |